# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2355/22 – 2023 ඔක්තෝබර් මස 24 වැනි අඟහරුවාදා – 2023.10.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2021/169.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අන්තර් සමාගම් සේවක සංගමය,
අංක 10,
නගර සභා පටුමග,
දෙහිවල.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

01. බෙන් හෝල්ඩිංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 42,
ආචාර්ය එන්.එම්.පෙරේරා මාවත,
කොළඹ 08.

02. හොටෙල් සෆායර්
අංක 371,
ගාලු පාර,
කොළඹ 06

03. හොටෙල් කොන්කෝඩ් ග්‍රෑන්ඩ්,
අංක 141,
ගාලු පාර,
දෙහිවල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බොරලැස්ගමුව, ජී. එච්. පෙරේරා මාවත, අංක 43/1 හි නීතිඥ ටී. සී. ජේ. පීරිස් මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2021/169.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

අන්තර් සමාගම් සේවක සංගමය,
අංක 10,
නගර සභා පටුමග,
දෙහිවල.

*සහ*

01. බෙන් හෝල්ඩිංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 42,
ආචාර්ය එන්.එම්.පෙරේරා මාවත,
කොළඹ 08.

02. හොටෙල් සෆායර්
අංක 371,
ගාලු පාර,
කොළඹ 06

03. හොටෙල් කොන්කෝඩ් ග්‍රෑන්ඩ්,
අංක 141,
ගාලු පාර,
දෙහිවල.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

"බෙන් හෝල්ඩිංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට අයත් හොටෙල් සෆායර් සහ හොටෙල් කොන්කෝඩ් ග්‍රෑන්ඩ් හි සේවකයින්ට පහත සඳහන් සිදුවීම් මගින් අසාධාරණයක් සිදුවී තිබේ ද යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම්, හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්නත් පිළිබඳ ව වේ."

හොටෙල් සෆායර්

- 2022 මාර්තු සිට අගෝස්තු දක්වා සේවා ගාස්තු නොගෙවීම.
- සේවකයින්ගේ සේවා ගාස්තුවෙන් 2020 මාර්තු සිට 2023 මාර්තු දක්වා 10% ක් මාසිකව කැඩුම් බිඳුම් සඳහා අඩුකිරීම සහ ඉතිරි හිඟ මුදල මෙම වසර 03 ඇතුළත ලබා නොදීම.
- සේවක සුභසාධනය වෙනුවෙන් වසර දෙකක් මාසිකව රු. 300/- බැගින් සේවකයින් 65 දෙනෙකුගෙන් අඩු කිරීම.
- වසර 05 කින් සේවක ඇගයීම් නොකිරීම හා වැටුප් වර්ධක ලබා නොදීම.
- වසර 05 කින් වැටුප් වැඩි කිරීමක් ලබා නොදීම.
- නිශ්චිතව මාසික වැටුප් ලේඛනයක් ලබා නොදීම.

හොටෙල් කොන්කෝඩ් ග්‍රෑන්ඩ්,

- 2022 මාර්තු සිට අගෝස්තු දක්වා සේවා ගාස්තු නොගෙවීම.
- සේවකයින්ගේ සේවා ගාස්තුවෙන් 2020 මාර්තු සිට 2023 මාර්තු දක්වා 10% ක් මාසිකව කැඩුම් බිඳුම් සඳහා අඩුකිරීම සහ ඉතිරි හිඟ මුදල මෙම වසර 03 ඇතුළත ලබා නොදීම.
- සේවක සුභසාධනය වෙනුවෙන් වසර දෙකක් මාසිකව රු. 300/- බැගින් සේවකයින් 28 දෙනෙකුගෙන් අඩු කිරීම.
- වසර 05 කින් සේවක ඇගයීම් නොකිරීම හා වැටුප් වර්ධක ලබා නොදීම.
- වසර 05 කින් වැටුප් වැඩි කිරීමක් ලබා නොදීම.
- නිශ්චිතව මාසික වැටුප් ලේඛනයක් ලබා නොදීම.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 10 – 00242

---

මගේ අංකය: IR/COM/05/2019/130.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

කේ. ජී. සී. ආර්. බණ්ඩාර මහතා,
අංක 117,
කපුවැල්ල,
නාපාවල,
අවිස්සාවේල්ල.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුළ පාර,
කොළඹ - 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බොරලැස්ගමුව, ජී. එච්. පෙරේරා මාවත, අංක 43/1 හි නීතිඥ ටී. සී. ජේ. පීරිස් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2019/130.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2022.08.20 වන දින අංක 2293/70 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.08.15 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

කේ. ජී. සී. ආර්. බණ්ඩාර මහතා,
අංක 117,
කපුවැල්ල,
නාපාවල,
අවිස්සාවේල්ල.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුළ පාර,
කොළඹ - 05.

අතර පවත්නා 2022.08.09 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ දොන් ලක්මාල් සමන් කුමාර වික්‍රමාරච්චිගේ මයා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු නීතිඥ දොන් ලක්මාල් සමන් කුමාර වික්‍රමාරච්චිගේ මයා බේරුම්කාර ධුරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2022.08.15 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2019/130.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

කේ. ජී. සී. ආර්. බණ්ඩාර මහතා,
අංක 117,
කපුවැල්ල,
නාපාවල,
අවිස්සාවේල්ල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුළ පාර,
කොළඹ - 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

01. "ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කරන ලද කේ. ජී. සී. ආර්. බණ්ඩාර මහතාට සේවය තහනම් කිරීමෙන් පසු කරන ලද විනය විභාගයෙන් අනතුරුව ලබා දෙන ලද තීන්දුව මඟින් ඔහුට අසාධාරණයක් සිදුව තිබේ ද? එසේ සිදුවී තිබේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේද? යන්නත් හා".

02. "කේ. ජී. සී. ආර්. බණ්ඩාර මහතාට III A ශ්‍රේණිය හා විධායක තනතුර හිමි ද, හිමි නම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? එසේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේ ද? කවදා සිටද යන්නත් පිළිබඳව වේ".

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජූලි මස 28 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 10 – 0243

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.